කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT












# පරන්තන් කෙමිකල් කම්පැණි ලිමිටඩ්

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2025

# සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම

## හැඳින්වීම

සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම ශ්‍රී ලංකාවේ රසායනික කර්මාන්තයේ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය අංශයේ සමාගමකි. රටේ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය, ආනයනය සහ බෙදා හැරීමේදී ඉතා වැදගත් කාර්යභාරයක් සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම ඉටු කරනු ලබයි.

සමාගම දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය වන දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය සැපයීමේ නිරතව සිටින අතර බ්ලීචින් දියර සහ පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය ද කරනු ලබයි.එසේම ක්ලෝරීන් භාවිතා කරන්නන් සඳහා හදිසි ආරක්ෂණ කට්ටල නිපදවීම සහ සැපයීම සිදු කරයි.

සී/ස පරන්තන් කෙමිකල් සමාගම ලාභ උපයන රාජ්‍ය ආයතනයක් වන අතර හොරණ, වගවත්ත අපනයන සැකසුම් කලාපයේ ක්ලෝරීන් ගබඩා පහසුකම් සහ නැවත පිරවීමේ ඒකකය පවත්වාගෙන යනු ලැබේ. මෙම ඒකකය සහ ගබඩා පහසුකම රටේ පාරිසරික සහ ආරක්ෂිත ප්‍රමිතීන් සපුරාලීම සඳහා ඉදිකරන ලද්දකි.ජාතික අවශ්‍යතාවයබසපුරාලීම සඳහා ප්‍රමාණවත් ක්ලෝරීන් සිලින්ඩර ප්‍රමාණයක් මෙම ස්ථානයේ ගබඩා කිරිමේ පහසුකම් පවතී.

## ආරම්භය සහ ඉතිහාසය:

1950 දශකයේ උතුරු පළාතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් හි රජයේ කර්මාන්තශාලාවක් වශයෙන් ආරම්භ කරන ලද පරන්තන් රසායනික කර්මාන්තශාලාව 1957 වර්ෂයේ දී පරන්තන් කෙමිකල්ස් සංස්ථාව වශයෙන් ස්ථාපනය කරන ලද අතර, ආරම්භයේදී මෙම කර්මාන්තශාලාව මඟින් දේශීය ලුණු අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතා කරමින් කෝස්ටික් සෝඩා, ක්ලෝරීන් වායුව සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ප්‍රධාන වශයෙන් ද සින්ක් ක්ලෝරයිඩ් හා පෙරික් ක්ලෝරයිඩ් අතුරු නිෂ්පාදන වශයෙන් ද වෙළඳපොලට ඉදිරිපත් කර ඇත. 1985 දී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් පරන්තන් රසායනික කර්මාන්තශාලාවේ වැඩ කටයුතු නවතා දමා ඇති අතර, මේ වන විට ක්‍රියාත්මක වන සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ පොදු සමාගම් පනත යටතේ 1991 ජනවාරි 17 වන දින සංස්ථාපනය කර ඇත.

## ප්‍රධාන කාර්යභාරය

සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගමේ ප්‍රධානම කාර්යභාරය වන්නේ රටේ රසායනික ද්‍රව්‍ය අවශ්‍යතා සපුරාලීම වන අතර පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සමාගම විශේෂ දායකත්වයක් දක්වනු ලබයි.

- **ජල පිරිපහදු කිරීම -** සමස්ත දිවයිනේම පානීය ජලය පිරිපහදු කිරීම සඳහා අත්‍යවශ්‍ය දියර ක්ලෝරීන් ප්‍රධාන වශයෙන් සැපයීම සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගමේ ප්‍රමුඛතම වගකීමක් වේ. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඇතුළු විවිධ ආයතන සඳහා දියර ක්ලෝරීන් සපයනු ලබයි.
- **වෙනත් රසායනික ද්‍රව්‍ය සැපයීම:** කෝස්ටික් සෝඩා, හයිඩ්‍රොක්ලෝරික් අම්ලය,පාරිභෝගික රසායන නිෂ්පාදන සහ වෙනත් රසායනික ද්‍රව්‍ය දේශීය කර්මාන්ත සඳහා ආනයනය කර බෙදාහරිනු ලබන අතර, රබර්, රෙදිපිළි, සබන් වැනි ද්‍රව්‍ය නිෂ්පාදනය කරන සමාගම් මෙම රසායනික ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනු ලබයි.
- **ආරක්ෂිතව රසායන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ දැනුවත් කිරීම:** රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව හසුරුවන ආකාරය පිළිබඳව පාරිභෝගිකයන්ට සහ අදාළ අංශවලට පුහුණුව ලබා දීම සමාගම විසින් සිදු කරනු ලබයි.

**ඉලක්ක සහ අභියෝග**

ප්‍රධාන ඉලක්ක

1. **කෝස්ටික් සෝඩා/ක්ලෝරීන් නිෂ්පාදන කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම:**
   පරන්තන්හි පිහිටි පැරණි කර්මාන්තශාලාව නැවත ආරම්භ කර දේශීයව රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගමේ ප්‍රධාන ඉලක්කයක් වන අතර, ඒ මගින් රටට විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත්, ආනයන මත යැපීම අඩු කිරීමත් ප්‍රධාන අපේක්ෂාව වේ.

2. **රසායනික වෙළඳපොළ ප්‍රමුඛත්වය ලබා ගැනීම**
   ශ්‍රී ලංකාවේ රසායනික නිෂ්පාදනයේ සහ බෙදා හැරීමේ ප්‍රමුඛයා බවට පත්වීම.


3. **නව නිෂ්පාදන හඳුන්වා දීම**
   බ්ලීචින් දියර සහ පාරිභෝගික නිෂ්පාදන වැනි නව නිෂ්පාදන දේශීය වෙළඳපොළට හඳුන්වා දීමට කටයුතු කිරීම.

අභියෝග

- **ආනයන මත යැපීම -** වර්තමානයේ සමාගමේ ආදායමෙන් විශාල කොටසක් ලැබෙන්නේ රසායනික ද්‍රව්‍ය ආනයනය සහ බෙදා හැරීමෙන් වන අතර, මෙය දේශීය ආර්ථිකයේ විවිධ වෙනස්කම් මත රඳා පවතින බැවින් ආදායමේ ස්ථාවරත්වයට අභියෝගයක් වේ.
- **තරඟකාරීත්වය:** රසායනික ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය පුද්ගලික සමාගම් සමඟ ඇති දැඩි තරඟකාරීත්වය .
- **ආරක්ෂිත ප්‍රමිතීන්:** රසායනික ද්‍රව්‍ය හැසිරවීම, ප්‍රවාහනය සහ ගබඩා කිරීමේදී ඉහළම ආරක්ෂිත ප්‍රමිතීන් පවත්වාගෙන යාම විශාල අභියෝගයකි.


**කාර්ය සාධන විශ්ලේෂණය**

ප්‍රස්ථාර අංක 1




| ආනයන (මෙට්‍රික් ටොන්) | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| ආනයන | 2899.7 | 3082.8 | 2591.4 | 2668.8 | 2153.7 |


ප්‍රස්ථාර අංක 2



| ආනයන(රු.මිලි) | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| ආනයන | 165 | 195 | 283.75 | 297 | 171 |

1 සහ 2 ප්‍රස්ථාරවලට අනුව සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගමේ මුළු ආනයනය 2020 වසරට වඩා 2021 ,2022 සහ 2023 වර්ෂවලදී සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. කෙසේ වෙතත්,2023 සහ 2024 වසරේදී සමාගමේ මුළු ආනයන ප්‍රමාණය 2020 ට සාපේක්ෂව අඩු වී ඇත.


ප්‍රස්ථාර අංක 3




| ආදායම(රු.මිලියන) | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| ආදායම | 306 | 392 | 722 | 770 | 702 |
| විකුණුම් පිරිවැය | 152 | 210 | 354 | 310 | 297 |
| දළ ලාභය | 154 | 182 | 368 | 460 | 405 |

3 වන ප්‍රස්ථාරයට අනුව 2020 සිට 2023 දක්වා සමාගමේ විකුණුම් ආදායම ක්‍රමයෙන් වැඩි වී ඇති බව පැහැදිලි වේ. කෙසේ වෙතත්, 2024 දී විකුණුම් ආදායම අඩුවීමක් පෙන්නුම් කරයි. සමාගමේ විකුණුම් පිරිවැය ද එකවර විකුණුම් ආදායමට සමාන උච්චාවචනයක් පෙන්නුම් කරයි. 2024 වසරේදී විකුණුම් පිරිවැයේ සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි.


ප්‍රස්ථාර අංක 4




| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 105 | 91 | 128 | 145 | 150.4 |
| වැටුප් සහ වේතන | 37 | 36 | 38 | 36 | 39 |
| අතිකාල සහ වෙනත් දීමනා | 6 | 5 | 7 | 10 | 12 |

4 වන ප්‍රස්ථාරයට අනුව, පුනරාවර්තන වියදම් 2020 සිට 2024 දක්වා ක්‍රමයෙන් වර්ධනය වී ඇත.


ප්‍රස්ථාර අංක 5



| බදු පෙර ලාභය | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| බදු පෙර ලාභය (රු.මිලියන) | 82 | 138 | 362 | 480 | 345 |

5 වන ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන්නේ 2020 වසරට සාපේක්ෂව 2021,2022 වර්ෂවල බදු පෙර ලාභය ක්‍රමයෙන් වැඩි වී ඇති අතර 2023 වර්ෂයේදී වැඩි වර්ධනයක් සහ 2024 වර්ෂයේදී එය නැවත තරමක් අඩු වී ඇත.

ප්‍රස්ථාර අංක 6




| සේවක සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| සේවක සංඛ්‍යාව | 55 | 51 | 50 | 45 | 44 |

සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගමේ මුළු සේවක සංඛ්‍යාව 2020 වසරේ සිට 2024 දක්වා සේවකයන් 55 සිට සේවකයන් 43 දක්වා අඩු වී ඇත.

**පවතින තත්වය පිළිබඳ නිරීක්ෂණ**

ආදායම 2020 දී රුපියල් මිලියන 306 සිට 2023 දී රුපියල් මිලියන 770 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස්, 2024 දී රුපියල් මිලියන 702 දක්වා පහළ ගොස් ඇත.

විකිණුම් වියදම් 2020 දී රු. මිලියන 152 සිට 2022 දී රු. මිලියන 354 දක්වා ඉහළ ගොස්, පසුව 2024 දී රු. මිලියන 297 දක්වා පහළ ගොස් ඇත.

සේවක සංඛ්‍යාව 2020 දී පුද්ගලයන් 55 සිට 2024 දී පුද්ගලයන් 43 දක්වා අඩුවී ඇත.

**සමස්ත ඇගයීම**

සමාගම පසුගිය වසර පහ තුළ ශක්තිමත් ආදායම් වර්ධනයක් පෙන්වා ඇති අතර, 2023 දී ඉහළ මට්ටමට ළඟා වී ඇත. එහෙත්, 2024 හි සුළු පහළ යාමක් පෙන්නුම් කරයි.

**ඉදිරි අභියෝග**

- කර්මාන්තශාලාව නැවත ගොඩනැගීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය සපයා ගැනීම
- රසායනික ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ ඇති දේශීය සහ විදේශීය තරඟකාරිත්වය
- අමුද්‍රව්‍ය මිල වෙනස්වීම් නිසා මතුවන  අපහසුතා.
- රසායනික ක්ෂේත්‍රයට අදාළ පාරිසරික නීති සහ නව නීතිමය සීමා.
- ප්‍රාදේශීය සහ ගෝලීය ආර්ථික අවදානම් තත්ව

**යෝජනා**

- කෝස්ටික් සෝඩා ක්ලෝරින් නිෂ්පාදන කර්මාන්තශාලාව ඉදිකිරීමේ කටයුතු කඩිනම් කිරීම
- ක්ලෝරීන් සහ කෝස්ටික් සෝඩා වලට අමතරව වර්තමාන වෙළඳපොල අවශ්‍යතා සපුරාලන වෙනත් රසායනික නිෂ්පාදන සඳහා යොමු වීම
- නිෂ්පාදන බෙදා හැරීමේ ජාලය ශක්තිමත්  කිරීම
- අලෙවි ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් ක්‍රමවේද භාවිතා කිරීම